සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

33 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

# ගිණුම්කරණය II

කාලය පැය තුනයි විනාඩි 10 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10)

උපදෙස්

- **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහක ට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

01 **විදුලි උපකරණ අලෙවි කිරීමේ නියුතු සීමිත ධනුක පොදු සමාගමේ 2019.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ සාරාංශයක් පහත දී ඇත.**

| විස්තරය | හර රු.'000 | බැර රු. '000 |
|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 70,000 | |
| 2018.04.01 තොගය | 2,000 | |
| ගැනුම් | 41,500 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 3,100 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 43,030 | |
| බෙදා හැරීමේ පිරිවැය | 3,800 | |
| පරිපාලන වියදම් | 4,200 | |
| වෙනත් වියදම් | 1,500 | |
| මූල්‍ය පිරිවැය | 200 | |
| ගෙවූ ලාභාංශ | 1,700 | |
| ගෙවූ ආදායම් බදු | 2,000 | |
| කල්බදු ගෙවීම් | 1,920 | |
| 2018.04.01 දිනට දේපල පිරියත උපකරණ සමුච්චිත ක්ෂය | | 17,500 |
| විකුණුම් | | 85,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 40,000 |
| 2018.04.01 දිනට ප්‍රත්‍යාගණන සංකේතය | | 1,500 |
| පොදු සංචිතය | | 600 |
| රදවාගත් ඉපැයුම් | | 7,250 |
| 12% බැංකු ණය (2018.10.01 දින ගත් ) | | 5,000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 17,000 |
| නඩු සඳහා වන්දි ප්‍රතිපාදන (2018.04.01) | | 150 |
| ආදායම් බදු ප්‍රතිපාදන (2018.04.01) | | 600 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ මත අපේක්ෂිත හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම (2018.04.01) | | 350 |
| | **174,950** | **174,950** |

**අතිරේක තොරතුරු.**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පහත සඳහන් දෑ සඳහා ගැලපීම් කළ යුතුවේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2019.06.15 දින නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂවරු අනුමැතිය ලබාදී ඇත.

i) 2019.03.31 දිනට තොගයේ පිරිවැය රු. 3,500,000 ක් වූ අතර ශුද්ධ උපලබ්ධි අගය රු. 3,650,000 ක් විය.

ii) සමාගමට එරෙහිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා තිබූ නඩුවක තීන්දුව 2019.04.25 දින අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ අනුව එදිනම රු. 400,000 ක් වන්දියක් ගෙවන ලෙස නියම කරන ලදී. ශේෂ පිරික්සුමේ දැක්වෙනුයේ ඒ වෙනුවෙන් කරන ලද ප්‍රතිපාදනය වේ.

iii) 2019.03.31 දිනට සිටි වෙළඳ ලැබිය යුතු දැ වලින් රු. 200,000 ණයගැතියෙකු බුන්වත් වී ඇති බව උසාවිය විසින් 2019.05.01 දින ප්‍රකාශයට පත් කරන ලද අතර එය හානිකරණ අලාභ ලෙස හඳුනාගත යුතු අතර වෙළෙඳ ලැබිය යුතු දැ මත අපේක්ෂිත හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම රු. 300,000 ක් ලෙස පවත්වාගත යුතු වේ.

iv) ව්‍යාපාරයේ සියලු වත්කම් එක පැකේජයක් ලෙස සලකා 2019.01.01 දින රු. 1,000,000 කට රක්ෂණය කරන ලදි 2020.01.01 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුළු වාරිකය ගෙවා එය පරිපාලන වියදම් තුළ දක්වා ඇත.

v) සමාගම ප්‍රවර්තන වර්ෂයේ සිට වගකීම් සහතික කාලයක් මත භාණ්ඩ විකිණීම සිදුකිරීමට තීරණය කරන ලදී. ඒ අනුව විකුණුම් මත 5% ක ප්‍රතිපාදනය කළ යුතු බව විශ්වාසදායිව ඇස්තමේන්තුකර ඇත.

vi) දේපළ, පිරියත හා උපකරණවල සංයුතිය හා ඒවායේ සමුච්චිත ක්ෂය පහත පරිදි වේ.

| විස්තරය | 2018.04.01 දිනට පිරිවැය/අගය (රු. 000) | 2018.04.01 දිනට සමුච්ත ක්ෂය (රු. 000) |
|---|---|---|
| ඉඩම් | 20000 | - |
| ගොඩනැගිලි | 25000 | 10000 |
| ලී බඩු, කාර්යාල උපකරණ | 10000 | 3000 |
| මෝටර් රථ | 15000 | 4500 |
| | 70,000 | 17,500 |

vii) ප්‍රවර්තන වර්ෂය තුළදී අත්පත් කරගත් හා ඉවත්කරන ලද දේපළ, පිරියත හා උපකරණ පහත පරිදි වේ.

- 2018.10.01 දින පිරිවැය 15,000,000 ක් වූ ගොඩනැගිල්ලක් මිලදී ගන්නා ලදී.
- 2019.03.31 දින පිරිවැය රු. 2,000,000 ක් හා ධරණ අගය රු. 16,000,000 වූ කාර්යාල උපකරණ රු. 1,650,000 කට විකුණන ලදී.

මෙම ගනුදෙනු සම්බන්ධයෙන් කිසිදු ගිණුම් තැබීමක් සිදුකර නැත.

viii) 2018.04.01 දින ඉඩම් රු. 18,000,000 කට දෙවන වරට ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයෙන් දැක්වේ.

ix) ගොඩනැගිලි, ලී බඩු කාර්යාල උපකරණ හා මෝටර් රථ පිරිවැය මත සරළ මාර්ග ක්‍රමයට 20% බැගින් ක්ෂය කළ යුතුය.

x) 2018.04.01 දින සමාගම කල්පබදු ගිවිසුමකට එළඹුණු අතර වසර 4 ක කාලයක් සඳහා යන්ත්‍රයක භාවිත අයිතිය ලබාගන්නා ලදී. 2018.04.01 දින යන්ත්‍රයේ භාවිත අයිතියේ පිරිවැය රු. 4,000,000 ක් වූ අතර ඵලදායී ජීවකාලය වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. 2018.04.01 දින මූලික ගෙවීම ලෙස රු. 960,000 ක් ද ප්‍රථම වාර්ෂික වාරිකය ලෙස රු. 960,000 ක් ද ගෙවන ලදී. මූලික මිණුම් කිරීමේදී කල්බදු වගකීම රු. 3,040,000 ක් විය. 2019.03.31 හා 2020.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කල්බදු පොලිය පිළිවෙලින් රු. 304,000 ක් හා රු. 238,000 ක් වේ. ගෙවන ලද මූලික ගෙවීම හා ප්‍රථම කල්බදු වාරිකය සටහන් කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නැත.

xi) වසර තුළ ගෙවූ ආදායම් බදු තුළ පෙර වර්ෂයට අදාළව ගෙවූ රු. 500,000 ක් ඇතුළත් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු වගකීම රු. 2,300,000 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත.

xii) පරිපාලන වියදම් තුළ අධ්‍යක්ෂ වේතන ලෙස ගෙවූ රු. 500,000 ක් ද විගණන ගාස්තු ලෙස ගෙවූ රු. 300,000 ක් ද, ඇතුළත් ය. බැංකු ණය සඳහා පොළිය උපචිතව ඇත.

xiii) 2019.06.15 දින අධ්‍යක්ෂවරු පොදු සංචිතයට රු. 800,000 ක් මාරු කිරීමටත් රු. 1,200,000 ක අවසාන ලාභාංශයක් ගෙවීමට යෝජනා කරන ලදී.

**අවශ්‍ය වන්නේ,**

LKAS -01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත ධනුක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද ඇතුළුව)

1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2). 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

3). 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 40)**

02. අ) 1) සීමිත දසුන් පොදු සමාගම A නැමැති භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. ඒ සඳහා P හා Q යනුවෙන් අමුද්‍රව්‍ය දෙකක් භාවිත කරයි. පහත තොරතුරු P හා Q යන අමුද්‍රව්‍යන්ට අදාළ වේ.

| | P | Q |
|---|---|---|
| සතියක උපරිම භාවිතය ඒකක | 15000 | 19000 |
| සතියක සාමාන්‍ය භාවිතය ඒකක | 14000 | 18000 |
| යළි ඇණවුම් ප්‍රමාණය (EOQ) ඒකක | 60000 | 80000 |
| උපරිම පොරොත්තු කාලය සති | 6 | 5 |
| සාමාන්‍ය පොරොත්තු කාලය සති | 5 | 4 |

**අවශ්‍ය වන්නේ,**

ඉහත P හා Q අමුද්‍රව්‍යයන්ට අදාළ පහත දෑ,

1) යළි ඇණවුම් මට්ටම
2) උපරිම තොග මට්ටම
3) අවම තොග මට්ටම
4) සාමාන්‍ය තොග මට්ටම

2) ''වන්නි'' මී කිරි නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනයට අදාළ දියර කිරි තොග සම්බන්ධයෙන් තොරතුරු පහත වේ.

- වාර්ෂික දියර කිරි භාවිතය ලීටර් 24000
- දියර කිරි ලීටරයක මිල රු. 24
- එක් ඇණවුමක් සඳහා දැරිය යුතු පිරිවැය රු. 50
- තොග පවත්වාගෙන යෑමේ පිරිවැය ලීටරයක පිරිවැයෙන් 10% කි.

**අවශ්‍ය වන්නේ,**

1) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) 2) වර්ෂයකට කළ යුතු ඇනවුම් වාර ගණන **(මුළු ලකුණු 20)**

ආ) සීමිත අහිංසා පොදු සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාරාංශගත ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා 2019.03.31 දිනට සංසන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.

**2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායමේ ප්‍රකාශනය**

| | (රු. '000) |
|---|---|
| විකුණුම් | 9500 |
| විකුණුම් පිරිවැය | (3800) |
| දළ ලාභය | 5700 |
| වියදම් | (2200) |
| බදු පෙර ලාභය | 3500 |
| ආදායම් බදු | (1250) |
| වර්ෂයේ ලාභය | 2250 |
| <u>වෙනත් විස්තීර්ණ ආදායම්</u> | |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම | 300 |
| මුළු විස්තීර්ණ ආදායම | 2550 |

**2019.03.31 දිනට හා 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | 2019.03.31 (රු.'000) | 2018.03.31 (රු.'000) |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණ ධාරණ වටිනාකම | 10000 | 11000 |
| 10% ආයෝජන (2019.03.31) මිල දී ගත්) | 2000 | - |
| තොගය | 400 | 650 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 750 | 930 |
| ඉදිරියට ගෙවූ මෙහෙයුම් වියදම් | 200 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ? | 420 |
| | ? | 13000 |

| | | |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් | 9000 | 8000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 300 | - |
| පොදු සංචිතය | 850 | 730 |
| රඳවාගත් ඉපයුම් | 5100 | 3500 |
| 10% බැංකු ණය (2018.04.01 දින ගත්) | 1200 | - |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 340 | 420 |
| ගෙවිය යුතු ආදායම් බදු | 350 | 250 |
| ගෙවිය යුතු පොලී | 60 | - |
| උපචිත මෙහෙයුම් වියදම් | - | 100 |
| | ? | 13000 |

**අතිරේක තොරතුරු,**

i) සියලු ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදුවිය.

ii) කාලච්ඡේදය අවසානයේ රඳවාගත් ඉපයුම් වලින් පොදු සංචිතයට මාරු කිරීමක් හා අතුරු ලාභාංශයක් ගෙවා ඇත. මීට අමතරව සංචිත ප්‍රාග්ධනිත කිරීමක් කර ඇත.

iii) දේපළ, පිරියත හා උපකරණ සඳහා වාර්ෂික ක්ෂය රු. 600,000 ක් වන අතර, සමාගම සතු රු. 5,000,000 ක් වූ ඉඩමක් රු. 5,300,000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. තවද 2019.03.31 දින රු. 700,000 ක ධාරණ අගය වූ යන්ත්‍රයක් රු. 500,000 කට විකුණා ඇත. අලාභය වියදම් තුළ දක්වා ඇත.

iv) වර්ෂය තුළ සමාගම එක් රු. 20 බැගින් වූ සාමාන්‍ය කොටස් 50,000 ක් නිකුත් කරන ලදී. මෙම කොටස් නිකුත් කිරීම තුළ රු. 300,000 ක රඳවාගත් ඉපයුම් භාවිත කරමින් සංචිත ප්‍රාග්ධනිත කිරීමක් ද ඇතුළත් විය. නිකුත් කළ ඉතිරි කොටස් සඳහා නිසි පරිදි මුදල් ලැබී තිබුණි.

**අවශ්‍ය වන්නේ,**

LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය. **(ලකුණු 20)**

**(මුළු ලකුණු 40)**

03. 2020 ජනාවරි මාසය තුළ නාරදගේ වෙළෙඳ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවල බලපෑම පහත ගිණුම් සමීකරණ තුළින් නිරූපණය වේ. (රු.'000)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | | වගකීම් | | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපල පිරියත උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | වෙනත් ලැබිය යුතු දෑ | මුදල් | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | බැංකු ණය | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයුම් |
| 2020.01.01 ශේෂ | **7000** | **2000** | **700** | **60** | **240** | **600** | **80** | **2000** | **6000** | **1320** |
| i. | | **-1500** | **+2000** | | | | | | | **+500** |
| ii. | | **+600** | | | **-200** | **+400** | | | | |
| iii. | | | | **-50** | **-10** | | | | | **-60** |
| iv. | | | **-500** | | **+450** | | | | | **-50** |
| v. | | | | | **-250** | | | **-200** | | **-50** |
| vi. | | **-500** | | | **+480** | | | | | **-20** |
| vii. | | | | | **-270** | **-300** | | | | **+30** |
| viii. | | | **-50** | | | | | | | **-50** |
| ix. | | | | | **-80** | | **-60** | | | **-20** |
| x. | **+1000** | | | | | | | | **+1000** | |
| xi. | **-50** | | | | | | | | | **-50** |
| xii. | | **-30** | | | | | | | | **-30** |

**අවශ්‍ය වන්නේ,**

1) ඉහත අංක (i) සිට (xii) දක්වා ගනුදෙනු වටිනාකම් සහිතව විස්තර කිරීම. (අයිතිකරු ගැනිලි සිදුකර නැති බව උපකල්පනය කරන්න.)
2) 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ වත්කම් ඇසුරින් ලාභය හෝ අලාභය
3) 2020.01.31 දිනට මුළු හිමිකම
4) වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරමින් 2020.01.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. **(මුළු ලකුණු 40)**

04. අ) ලහිරු, විමුක්ති හා තරිඳු පවත්වාගෙන යනු ලබූ හවුල් ව්‍යාපාරයේ සාරාංශගත කරන ලද 2018.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත වේ.

| **වත්කම්** | **(රු. 000)** |
|---|---|
| දේපළ, පිරියත හා උපකරණ (ධාරණ වටිනාකම) | 12000 |
| 12% ආයෝජන | 7000 |
| තොගය | 700 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 600 |
| මුදල් හා මුදල් සමාන දෑ | 500 |
| | 20800 |
| **හිමිකම් හා වගකීම්** | |
| හිමිකම - ලහිරු | 6500 |
| විමුක්ති | 5000 |
| තරිඳු | 2800 |
| 20% බැංකු ණය | 6000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 500 |
| | 20800 |

**අතිරේක තොරතුරු,**

i) ලහිරු, විමුක්ති හා තරිඳු හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත වේ.
- ලහිරු, විමුක්ති හා තරිඳු පිළිවෙලින් ලාභාලාභ 2:2:1 අනුපාතයට බෙදා ගැනීම
- සෑම හවුල්කරුවකුටම මසකට රු. 20,000 බැගින් වේතන හිමිවේ.
- ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂ සඳහා 10% ක ප්‍රාග්ධන පොලියක් හිමිවේ.
- හවුල්කරුවන් විසින් සපයා ඇති ණය වෙනුවෙන් 12% ක පොලියක් ගෙවීම.

ii) 2018.04.01 දිනට ඇති හවුල්කරුවන්ගේ හිමිකම තුළ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂ පහත පරිදි විය.

| **ප්‍රාග්ධන ගිණුම් ශේෂ** | **(රු. '000)** |
|---|---|
| ලහිරු | 5000 |
| විමුක්ති | 4000 |
| තරිඳු | 3000 |

iii) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගනුදෙනුවල සාරාංශයක් පහත වේ.

| **තොරතුරු** | **(රු. '000)** |
|---|---|
| විකුණුම් (මෙයින් 70% ක් ණය පදනම මත වේ) | 10000 |
| ගැනුම් (මෙයින් 60% ණය පදනම මත වේ) | 4000 |
| ණයගැති ලැබීම් | 7100 |
| ණයහිමි ගෙවීම් | 2300 |
| මෙහෙයුම් වියදම් ගෙවීම් (ණය පොලී රහිතව) | 1200 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | 300 |
| ගැනිලි (සෑම හවුල්කරුවකටම රු. 50,000 බැගින්) | 150 |

iv) 2019.03.31 දිනට තොගය රු. 800,000 ක් විය.

v) ගෙවූ මෙහෙයුම් වියදම් තුළ ලහිරුගේ පෞද්ගලික ආදායම් බදු ලෙස ගෙවූ රු. 50,000 ක් ඇතුළත් වේ.

vi) විමුක්ති විසින් තමා සතුව තිබූ මෝටර් රථයක් ව්‍යාපාරයට 2018.10.01 දින යොදවන ලදී. එහි පිරිවැය හා සුන්බුන් අගය පිළිවෙලින් රු. 2,200,000 ක් හා රු. 200,000 ක් විය. එහි ඵලදායි ජීව කාලය වසර 05 කි. මෝටර් රථය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමට තීරණය කරන ලදී. මේ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල තබා නැත.

vii) තරිඳු විසින් රු. 500,000 ක ණය මුදලක් 2019.01.01 දින සපයන ලදී. ඒ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල තබා නැත.

viii) ආයෝජන සඳහා පොලිය ලැබිය යුතුව ඇත. බැංකු ණය පොලී ගෙවා නැත.

ix) 2019.03.31 දින තරිඳු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. එදිනට ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 2,000,000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. එදින සිට ලහිරු හා විමුක්ති සම සමව ලාභාලාභ බෙදාගැනීමට ගිවිස ගන්නා ලදී. එදිනම තරිඳුට ගෙවිය යුතු මුදලින් 50% ක් මුදලින් ගෙවන ලද අතර ඉතිරි 50% ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය.

**අවශ්‍ය වන්නේ,**

1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල් කරුවන්ට සිදුකරන ලද විසර්ජනයන්ද සමඟ)
2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුගේ ප්‍රාග්ධන ගිණුම්, ජංගම ගිණුම් හා තරිඳුගේ ණය ගිණුම.
3) වෙළෙඳ ලැබිය යුතු දෑ, වෙළෙඳ ගෙවිය යුතු දෑ හා වෙනත් ලැබිය යුතු දෑ හා වෙනත් ගෙවිය යුතු දෑ ගිණුම්වල 2019.03.31 දිනට ශේෂයන්. **(ලකුණු 25)**

(ආ) 2018.04.01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද සීමිත තුරුලිය පොදු සමාගමේ පහත තොරතුරු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

| | (රු. '000) |
|---|---|
| විකුණුම් ආදායම | 12000 |
| විකුණුම් පිරිවැය | 6000 |
| වියදම් (ණය පොළි සහිතව) | 1000 |
| ආදායම් බදු | 500 |
| වර්ෂය සඳහා ලාභය | 4500 |
| තවද 2019.03.31 දිනට පහත ශේෂද පැවතුණි. | |
| මුළු වත්කම් | 18000 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටසක නිකුතු අගය රු. 30) | 6000 |
| සංචිත | 4000 |
| මුළු වගකීම් | 8000 |

- මුළු වත්කම් වලින් 40% ක් ජංගම වත්කම් වේ. ඒ තුළ රු. 500,000 තොගයක් ඇතුළත් වේ.
- මුළු වගකීම් වලින් 50% ක් දිගු කාලීන බැංකු ණය වන අතර ඉතිරිය ජංගම වගකීම් වේ. ණය පොලිය 20% කි.
- කාලච්ඡේදය තුළ රු. 500,000 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

**අවශ්‍ය වන්නේ,**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කිරීම.

1) ජංගම අනුපාතය 2) පොළී ආවරණ අනුපාතය
3) දළ ලාභ අනුපාතය 4) තොග රඳවා ගැනීමේ කාලය
5) කොටසක ලාභාංශය (වර්ෂයකට දින 360 ක් යැයි උපකල්පනය කරන්න) **(ලකුණු 15)**

**(මුළු ලකුණු 40)**

05. (අ) එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන විශ්වගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයට අදාළ තොරතුරු පහත වේ. (මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පිළිබඳව)

i)

| **මුදල් ලැබීම** | (රු. '000) |
|---|---|
| අත්පිට විකුණුම් 10% ක් VAT සහිතව | 660 |
| ණය ගැති ලැබීම් -ලාල් (රු. 80000 ක වට්ටමකට යටත්ව) | 720 |
| කොමිස් ආදායම් | 200 |
| අත්පිට විකුණුම් 10% ක VAT සහිතව | 1100 |
| ණයගැති ලැබීම් - නිහාල් | 280 |
| **මුදල් ගෙවීම්** | |
| අත්පිට ගැනුම් 10% VAT සහිතව | 440 |
| ණය හිමියන්ට ගෙවීම් - සිසිර | 160 |
| විදුලි වියදම් | 30 |
| අත්පිට ගැනුම් 10% ක VAT සහිතව | 220 |
| ණය හිමියන්ට ගෙවීම් - බණ්ඩාර (රු. 30,000 ක වට්ටමකට යටත්ව) | 270 |
| වැටුප් | 80 |
| VAT | 70 |

ii) 2020 ජනවාරි මාසයේ බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ සාරාංශය පහත වේ.

| | (රු. '000) |
|---|---|
| උපලබ්ධි වූ චෙක් | 1580 |
| නිකුත් කළ චෙක්පත් සඳහා ගෙවීම් | 900 |
| බැංකුව අයකළ බැංකු ගාස්තු | 10 |
| තැම්පත් කළ අගරු වූ චෙක් | 280 |
| ණයගැති ඍජු ප්‍රේෂණ | 150 |
| ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරික | 30 |

iii) 2019.12.31 දින මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 450,000 ක් විය. එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ විය.

**අවශ්‍ය වන්නේ,**

1). 2020 ජනාවරි මාසයේ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ජ'නල්

2). 2020.01.31 දිනට බැංකු ගිණුම සංශෝධනය කර බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම.

**(ලකුණු 20)**

(ආ) ආයතනයක භාවිත කරන මෝටර් රථ පිළිබඳව තොරතුරු පහත වේ.

| **මෝටර් රථ** | **පිරිවැය (රු.000)** | **සුන්බුන් අගය (රු.000)** | **ජීව කාලය (අවු)** | **මිලදීගත් දිනය** |
|---|---|---|---|---|
| $M/V_1$ | 3200 | 200 | 10 | 2015.04.01 |
| $M/V_2$ | 4200 | 600 | 9 | 2015.10.01 |
| $M/V_3$ | 3500 | 500 | 5 | 2016.04.01 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ මෝටර් රථ සම්බන්ධව සිදුකරන ලද ගනුදෙනු පහත වේ.

1. $M/V_1$ මෝටර් රථය 2018.10.01 දින රු. 2,600,000 කට විකුණන ලද අතර එදිනම රු. 4,200,000 කට $M/V_4$ මෝටර් රථය මිලදී ගන්නා ලදී. එහි සුන්බුන් අගය රු. 700,000 ක් හා ඵලදායී ජීවකාලය වසර 7 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.
2. 2018.04.01 දින $M/V_2$ රථයේ ඉතිරි ඵලදායි ජීවකාලය වර්ෂ 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.
3. 2018.04.01 දින $M/V_3$ රථය රු. 1,300,000 ක ප්‍රාග්ධන වැයක් දරා නවීකරණය කරන ලදී. ඒ නිසා එහි සුන්බුන් අගය රු. 600,000 ක් ලෙස ඇස්තුමේන්තු කරන ලදී.
4. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රක්ෂණ සහතික හා ආදායම් බලපත්‍ර සඳහා රු. 900,000 ක් වැය කරන ලදී.

**අවශ්‍ය වන්නේ,**

2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ

1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත ගිණුම්

   1. මෝටර් රථ ගිණුම
   2. මෝටර් රථ සමුච්චිත ක්ෂය ගිණුම
   3. මෝටර් රථ ඉවත් කිරීමේ ගිණුම

2). LKAS – 16 (දේපළ, පිරියත හා උපකරණ) ප්‍රමිතයට අනුව 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අදාල දේපළ, පිරියත උපකරණ සටහන.

**(ලකුණු 20)**

**(මුළු ලකුණු 40)**

06. (අ) තිළිණගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවූ හෙයින් වෙනස අවිනිශ්චිත ගිණුමක ලියා තබන ලදී. එදිනට කෙටුම්පත් කරන ලද ආදායම් ප්‍රකාශනයට අනුව වර්ෂය සඳහා ලාභය රු. 650,000 ක් විය. පසුව ගිණුම් පරීක්ෂාවේ දී පහත කරුණු ආවරණය විය.

i) විකුණුම් ජ'නලයේ වටිනාකම තීරුවේ එකතුව රු. 450,000 විකුණුම් ගිණුමට පිටපත් කර තිබුණේ රු. 540,000 ක් ලෙසය.

ii) ණය ගැතියෙකුගෙන් අයවිය යුතු රු. 14000 ක් හානිකරණ අලාභ (බොල්ණය) ලෙස කපා හැර ඇතත් ඒ පිළිබඳ පොදු ලෙජරයේ කිසිදු සටහනක් තබා නැත.

iii) 2018.10.01 දින මිලදී ගත් රු. 60,000 ක කාර්යාල උපකරණ කාර්යාල වියදම් ගිණුමට හර කර ඇත. ව්‍යාපාරය සියලු දේපළ පිරියත උපකරණ පිරිවැය මත 10% බැගින් ක්‍ෂය කරනු ලැබේ.

iv) බැංකු ණය සඳහා ගෙවූ පොලී රු. 10,000 ක් ලද පොලී ගිණුමට බැර කර ඇත.

v) ඉදිරි වර්ෂය සඳහා ලද විකුණුම් අත්තිකාරම් රු. 40,000 ක් විකුණුම් ගිණුමට බැර කර ඇත.

vi) මෝටර් රථ ගිණුමේ ශේෂය වූ රු. 4,000,000 ක් ශේෂ පිරික්සුමේ සටහන් කර ඇත්තේ රු.400,000 ක් ලෙසය.

vii) රු. 25000 ක භාණ්ඩ ණයට ගැනුම් පිළිබඳ ඉන්වොයිසිය සම්පූර්ණයෙන් මගහැරී ඇත.

viii) මුදල් ගෙවීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු. 30,000 ක් ලද වට්ටම් ගිණුමට හර කර ණයහිමි පාලන ගිණුමට බැර කර ඇත.

ix) 2019.03.31 දිනට තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිරිවැයට වඩා රු. 35,000 ක් අඩුවිය. කෙසේ නමුත් වර්ෂයේ ලාභය ගණනයේදී අවසන් තොගය පිරිවැයට තක්සේරු කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

1) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්

2). 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ශුද්ධ ලාභය

3) ඉහත (ii),(iii),(v) හා (ix) යන වැරදි හා මගහැරීම් වලට අදාළ ගිණුම්කරණ සංකල්ප **(ලකුණු 20)**

ආ) ඇඟළුම් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2020 ජනවාරි මාසයට අදාළ පිරිවැය අයිතම පහත වේ.

| | | (රු.) |
|---|---|---|
| i. | කර්මාන්ත ශාලාවේ කුලිය මාසයකට | 20000 |
| ii. | එක් ඇඳුමකට අවශ්‍ය රෙදිවල පිරිවැය | 800 |
| iii. | මහන මැෂින් ක්‍රියාකරුවන්ගේ වැටුප එක් ඇඳුමකට | 300 |
| iv. | සුපරීක්‍ෂක වේතන මාසයකට | 18000 |
| v. | යන්ත්‍ර ක්‍ෂය මාසයකට | 2000 |
| vi. | නූල්, බොත්තම් එක් ඇඳුමකට | 20 |
| vii. | විකුණුම් සේවක වේතන මාසයකට | 15000 |
| viii. | මහන මැෂින් සඳහා හා කම්හල් ගොඩනැගිලි විදුලිය මාසයකට | 4000 |
| ix. | කාර්යාල ගොඩනැගිල්ල සඳහා විදුලිය මාසයකට | 1000 |
| x. | කාර්යාලීය දුරකථන හා ලිපිද්‍රව්‍ය (මාසයකට) | 500 |
| xi. | කාර්යාල ගිණුම් ලිපිකරුගේ වැටුප මාසයකට | 20000 |

අවශ්‍ය වන්නේ,

1) ඉහත එකිනෙක පිරිවැය අයිතමය පහත දැක්වෙන වර්ගීකරණය යටතේ උචිත තීරුවේ (✓) ලකුණු යොදමින් පහත පරිදි වෙන්කර දැක්වීම නිෂ්පාදන නොවන පිරිවැය අයිතම සෘජු හෝ වක්‍ර ලෙස වර්ග කිරීම අවශ්‍ය නොවේ.

| පිරිවැය අයිතමය අංක | සෘජු D හෝ වක්‍ර IND | | විචල්‍ය (VC) හෝ ස්ථාවර (FC) | | නිෂ්පාදන M හෝ නිෂ්පාදන නොවන NM | |
|---|---|---|---|---|---|---|
| | D | IND | VC | FC | M | NM |
| i. | | ✓ | | ✓ | ✓ | |
| ii. | | | | | | |

2). මාසය තුළ නිෂ්පාදිත ඇඳුම් ඒකක 1000 ක් යැයි උපකල්පනය කර

1. ඒකකයක ප්‍රාථමික පිරිවැය 2. ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

3. මුළු නිෂ්පාදන පිරිවැය 4. මුළු පිරිවැය **(ලකුණු 20)**

**(මුළු ලකුණු 40)**